රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 01/2017

මගේ අංකය :MPA/IAD/ADM/GA 13/SPORTS.2017
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.
2017.01.25

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

**ක්‍රීඩා හා ශරීර සුවතා ප්‍රවර්ධන ජාතික සතිය -2017 පෙබරවාරි 06-12**

ජනාධිපති කාර්යාලය විසින් නිකුත් කරන ලද 2017 ජනවාරි මස 06 වන දිනැති චක්‍රලේඛ අංක SP/SB/01/17 මගින් අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි ක්‍රීඩා අමාත්‍යාංශය මගින් සංවිධානය කරනු ලබන **"ක්‍රීඩා හා ශරීර සුවතා ප්‍රවර්ධන ජාතික සතිය"** 2017 පෙබරවාරි මස 06 වන දින සිට 12 වන දින දක්වා දිවයින පුරා ක්‍රියාත්මක කිරීමට රජය විසින් පියවර ගෙන ඇත. රාජ්‍ය සේවකයින්ගේ ශරීර සුවතා ප්‍රවර්ධනය මගින් ශ්‍රී ලංකාව තුල සීඝ්‍රයෙන් ඉහළ යන බෝ නොවන රෝග පිළිබඳ තත්ත්වයන් පාලනය කිරීම සඳහා සාර්ථක ආරම්භයක් ලබා දීම මෙහි අරමුණ වේ.

02. ඒ අනුව 2017 පෙබරවාරි 06 වන දින **"ක්‍රීඩා හා ශරීර සුවතා ප්‍රවර්ධන රාජ්‍ය සහ සංස්ථා නිලධරයන්ගේ දිනය"** ලෙස නම් කර ඇත. නිරෝගී රාජ්‍ය සේවකයින් මගින් කාර්යක්ෂම, ඵලදායී රාජ්‍ය සේවයක් ලබා දීමේ අරමුණින් සියලුම රාජ්‍ය ආයතනවල රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2016 ට අනුව කටයුතු කළ අයුරින්ම මෙවර ද 2017 පෙබරවාරි 06 වන දින පෙ.ව.8.30 සිට පහත සඳහන් වැඩපිළිවෙල යොදාගත යුතුය.

I. සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයන් ඉදිරිපිට දී ආයතනයෙහි හෝ කාර්යාලයෙහි ප්‍රධානියා ජාතික ධජය එසවීම.

II. ජාතික ධජය එසවීමෙන් අනතුරුව ජාතික ගීය ගායනා කිරීම.

III. නීරෝගී ජීවිතයක් තුළින් කාර්යක්ෂම ඵලදායී රාජ්‍ය සේවයක් ලබා දීම සඳහා ශරීර සුවතා ව්‍යායාම හා පෝෂණයෙහි ඇති වැදගත්කම පිළිබඳව කෙටි දේශනයක් පැවැත්වීම.

IV. සියලුම කාර්ය මණ්ඩලයට කාර්යාලයීය ඇඳුමින් සහභාගී විය හැකි සරළ ව්‍යායාම වැඩසටහන් (මිනිත්තු15ක) ක්‍රියාත්මක කිරීම.

03. නිරෝගී රාජ්‍ය සේවකයින් මගින් කාර්යක්ෂම, ඵලදායී රාජ්‍ය සේවයක් ලබා දීමේ අරමුණ සාර්ථක කර ගැනීම සඳහා සුදුසු වැඩසටහන් ඉදිරියටත් ක්‍රියාත්මක කිරීමට මුලිකත්වය ගෙන කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය

පිටපත්- 1. ගරු පළාත් ආණ්ඩුකාරවරුන්
2.ජනාධිපති ලේකම්
3. ලේකම් - ක්‍රීඩා අමාත්‍යාංශය - සුදුසු ශාරීරික යෝග්‍යතා උපදේශකවරුන් සියලුම රාජ්‍ය ආයතන වෙත යොමු කිරීම සඳහා